# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
# මධ්‍ය වාර පරීක්ෂණය - 2014
## භූගෝල විද්‍යාව I - II
## I කොටස

**08 ශ්‍රේණිය** **කාලය :- පැය 02**

---

නම / විභාග අංකය :- ........................................................................................

✹ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**අංක 1 - 5 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සෞරග්‍රහ මණ්ඩලයේ උපග්‍රහයන් වැඩිම ග්‍රහලෝකය වන්නේ,
 i. බ්‍රහස්පතිය ii. සෙනසුරුය iii. යුරේනස්ය iv. නෙප්චූන්ය

02. ලොව ජීවය ආරක්ෂා කරන ඕසෝන් වියන පිහිටි වායුගෝලයේ ස්තරය වන්නේ,
 i. පරිවර්ති ගෝලය යි. ii. අපරවර්ති ගෝලයයි.
 iii. මෙසෝ ගෝලය යි. iv. තාප ගෝලය යි.

03. 2007 දී අප දකුණු ආසියා කලාපයට අලුතින්ම එක් වූ රටේ අගනුවර වන්නේ,
 i. නවදිල්ලිය ii. කත්මන්ඩුය
 iii. කාබුල්ය iv. ඉස්ලාමාබාද්ය

04. දකුණු ආසියා කලාපයේ වනාන්තර ප්‍රතිශතය වැඩිම රටවල් දෙක ඇතුළත් කාණ්ඩය විය හැක්කේ,
 i. ඉන්දියාව, ශ්‍රී ලංකාව ii. භූතානය, බංගලාදේශය
 iii. ශ්‍රී ලංකාව, පකිස්ථානය iv. නේපාලය, භූතානය

05. මෙම සෘතුව උදාවන විට ගස්වල කොළ හැළීම ආරම්භ වේ. මුළු පරිසරය වියළි ස්වභාවයක් දක්නට ලැබේ. දිවා රාත්‍රී කාලය එක සමාන වේ. මෙම සෘතුව වන්නේ,
 i. ග්‍රීෂ්මහාන ii. සරත්
 iii. වසන්ත iv. සිසිර (ශීත)

**6 - 10 දක්වා ප්‍රශ්න සඳහා වාක්‍යයෙන් කියවෙන අදහස වැරදිනම් ( x ) ලකුණද හරිනම් ( √ ) ලකුණ ද ඉදිරියෙන් යොදන්න.**

06. බංගලාදේශය හා පාකිස්ථානය සාගර සම්පත නොමැති රටවල් දෙකක් ලෙස පිළිගැනේ. (....................)

07. නේපාලය හා භූතානය යන රටවල් දෙකෙහි වැඩිපුරම මොංගොලොයිඩ් ජනවර්ගය ජීවත්වන බව පෙනී යයි. (....................)

08. බංගලාදේශය ගංගා මුවදොරක් හා තැනිතලාවක් නිසා නිරන්තර ජල ගැලීම් වලට ලක්වන රටකි. (....................)

09. ලොව විශාලතම කාන්තාරය වන සහරා කාන්තාරය දකුණු ආසියාවේ පිහිටා තිබේ. (....................)

10. ආසියාවේ කෘෂිකර්මාන්තය යැපුම් හා ව්‍යාපාරික කෘෂිකර්මාන්තය ලෙස කොටස් දෙකකට බෙදා දක්වා ඇත. (..................)

**11 - 15 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැනෙහි ලියා දක්වන්න.**

11. "දිවෙහි භාෂාව" ප්‍රධාන භාෂාව ලෙස භාවිතා කරන රට ....................................................ය.
12. සින්ධු, නර්මදා, කාවේරි, ගංගා අයත් රට .................................................... ය.
13. කත්මන්ඩු .................................................... නම් රටේ අගනුවර වේ.
14. දකුණු ආසියාව තුළ වැඩිම මුස්ලිම් ජනගහනයක් සිටින රට ලෙස .................................................... හඳුනාගත හැකිය.
15. බෙංගාලි ප්‍රධාන ජනවර්ගය වන බෙංගාලි හා උර්දු ප්‍රධාන භාෂා වන රට වන්නේ .................................. යි.

**(නේපාලය, ඉන්දියාව, පකිස්ථානය, මාල දිවයින, බංගලාදේශය)**

**16 සිට 20 දක්වා ප්‍රශ්න වලට ලෝක සිතියම භාවිතා කර පිළිතුරු සපයන්න.**

16. ඉන්දියාවේ ගංගානම් ගඟ ඇඳ නම් කරන්න.
17. දකුණු ඇමරිකාවේ බ්‍රසීලියානු සානුව ඇඳ දක්වන්න.
18. අප්‍රිකාවේ කොංගෝ තැනිතලාව ලකුණු කරන්න.
19. පංච මහා විල් ලකුණු කරන්න.
20. ආසියාවේ හිමාලය කඳු වැටිය ඇඳ නම් කරන්න. (ලකුණු 2 x 20 = 40)

<u>ලෝක සිතියම</u>



## II කොටස

**පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 4 කටත් පමණක් පිළිතුරු සපයන්න.**

01. II වරායට අදාළ ඔබ විසින් සිදුකරන ලද තොරතුරු කට්ටලය සැකසීමේ ඇගයීම් ක්‍රියාවලිය ඇසුරින් පිළිතුරු සපයන්න.

i. ඉහත ඇගයීම සිදුකරන ලද්දේ පෙළ පොතේ කුමන මාතෘකාව ඇසුරෙන්ද ? ( ල.2 )

ii. මේ තොරතුරු කට්ටලය සැකසීම සඳහා ඔබට ලැබුණු ගුරු උපදෙස් 2 ක් ලියා දක්වන්න. ( ල.4 )

iii. මේ සඳහා ඔබට ලබා දුන් අනුමාතෘකා 02 ක් නම් කරන්න. ( ල.4 )

iv. ක්‍රියාකාරකම තුළින් ඔබ ලබාගත් අත්දැකීම් 02 ක් සඳහන් කරන්න. ( ල.4 )

v. ඔබ තොරතුරු සොයාගත් මූලාශ්‍ර 02 ක් සඳහන් කරන්න ( ල.2 )

02. i. පෘථිවි පරිභ්‍රමණය යනු කුමක්ද ? ( ල.2 )

ii. පෘථිවි භ්‍රමණයේ ප්‍රතිඵල 02 ක් සඳහන් කරන්න. ( ල.4 )

iii. නැගෙනහිර දේශාංශ 80 පිහිටි කොළඹ නගරයේ වේලාව දහවල් 12.00 වන විට දේශාංශ 0 පිහිටි ග්‍රිනිච් නගරයේ වේලාව ගණනය කරන්න. ( ල.5 )

03. i. වායුගෝලයේ ප්‍රධාන ස්තර 04 කි. ඉන් 02 ක් නම් කරන්න. ( ල.2 )

ii. ඉහල හා මධ්‍ය අක්ෂාංශ ප්‍රදේශවලට බලපාන ප්‍රධාන සෘතු හතර නම් කරන්න.(ල.4)

iii. පෘථිවි ගෝලය ප්‍රධාන කොටස් 4 ක නිර්මාණයකි. එම කොටස් 4න් 3 ක් නම් කර එක කොටසක් ගැන කෙටියෙන් පහදන්න. ( ල.5 )

04. i. දකුණු ආසියාවේ ජනගහනය වැඩිම රටවල් දෙක නම් කරන්න. ( ල.2 )

ii. දකුණු ආසියාවේ සාපේක්ෂ පිහිටීම ලියා දක්වන්න. ( ල.4 )

iii. දකුණු ආසියාවේ ප්‍රධාන දේශගුණ ලක්ෂණ 03 ක් නම්කර එකක් ගැන කෙටියෙන් පහදන්න. ( ල.5 )

05. i. දකුණු ආසියාතික කලාපයේ බෞද්ධාගම ප්‍රධාන රටවල් 02 ක් නම්කරන්න. ( ල.2 )

ii. හණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන 04 ක් නම් කරන්න. ( ල.4 )

iii. හණ කර්මාන්තය බංගලාදේශයේ ජන ජීවිතය කෙරෙහි බලපාන ආකාරය කරුණු 02 ක් යටතේ පහැදිලි කරන්න. ( ල.5 )

06. i. ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශවල භාවිතා කෙරෙන බලශක්ති දෙකක් නම් කරන්න.( ල.2 )

ii. එම ග්‍රාමීය ජනයා බලශක්තිය ලබා ගැනීමේදී මුහුණපාන ගැටළු 02 ක් සඳහන් කරන්න. ( ල.4 )

iii. බලශක්ති භාවිතය ග්‍රාමීය ජන ජීවිතය කෙරෙහි යහපත් ලෙස බලපාන ආකාරය ගැන කරුණු 02 ක් යටතේ පහදන්න. ( ල.5)

07. i. දකුණු ආසියාවේ සැපුම් කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ලක්ෂණ 02 ක් සඳහන් කරන්න. ( ල.2 )

ii. පහත දකුණු ආසියාතික සිතියමේ A,B,C,D යනුවෙන් දක්වා ඇති රටවල් 4 නම් කරන්න. ( ල.4 )




iii. A. මාලදිවයිනේ සංචාරක කර්මාන්තය වර්ධනයට හේතු වූ කරුණු 02 ක් සඳහන් කරන්න. ( ල.2 )

B. එසේම සංචාරක කර්මාන්තය තුළින් ඒ රට සංස්කෘතිය රැක ගැනීමට රජය ගෙන ඇති පියවර කෙටියෙන් පහදන්න. ( ල.3 )